10 අනුලෝම සමානුපාත

මෙම පාඩම ඉගෙනීමෙන් ඔබට,

- අනුලෝම සමානුපාත හඳුනාගැනීමට
- ඒකීය ක්‍රමය භාවිතයෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳීමට
- අර්ථ දැක්වීම භාවිතයෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳීමට
- අනුලෝම ලෙස සමානුපාතික රාශි දෙකක් අතර සම්බන්ධය $y = kx$ ආකාරයට ලියා දැක්වීමට
- අනුලෝම සමානුපාත පිළිබඳ දැනුම යොදා ගනිමින් විදේශ මුදල් පරිවර්තනය සම්බන්ධ ගැටලු විසඳීමට

හැකියාව ලැබෙනු ඇත.

10.1 අනුලෝම සමානුපාත හැඳින්වීම

එක්තරා වර්ගයක පෑන් ගණනත් ඊට අදාළ මිලත් වෙනස්වන ආකාරය පහත වගුවේ දැක්වේ.

පෑන් ගණන	මිල (රු)
1	15
2	30
3	45
4	60
5	75
6	90

ඉහත වගුවට අනුව පෑන් ගණන වැඩි වන විට ඊට අනුරූප මිල ද වැඩි වන බව පෙනේ. පෑන් ගණන හා ඒවායේ මිල, රාශින් දෙකක් ලෙස සලකමු.

ඉහත නිදසුනට අනුව, පැන් ප්‍රමාණයේ අගයන් දෙකක් හා ඊට අනුරූප මිල ගණන් දෙක අතර අනුපාත කිහිපයක් පහත වගුවේ දැක්වේ. එම අනුපාත සමාන බව නිරීක්ෂණය කරන්න.

පැන් ගණන අතර අනුපාතය	ඊට අනුරූප මිල ගණන් අතර අනුපාතය
1 : 2	15 : 30 = 1 : 2
1 : 3	15 : 45 = 1 : 3
2 : 3	30 : 45 = 2 : 3
3 : 5	45 : 75 = 3 : 5
2 : 5	30 : 75 = 2 : 5

එකිනෙකට වෙනස් රාශි දෙකක් එකම අනුපාතයකින් වැඩිවේ නම් හෝ අඩුවේ නම් එම රාශි අනුලෝම සමානුපාත ලෙස හැඳින් වේ.

අනුලෝම සමානුපාත වන රාශි දෙකෙන් එක් රාශියක් වැඩිවන විට අනෙක් රාශිය ද ඊට සමාන අනුපාතයකින් වැඩි වන බව ඔබට නිරීක්ෂණය කළ හැකි ය.
එසේ ම අනුලෝම සමානුපාත වන රාශි දෙකෙන් එක් රාශියක් අඩුවන විට අනෙක් රාශිය ද ඊට සමාන අනුපාතයකින් අඩු වේ.

10.1 අභ්‍යාසය

1. පහත එක් එක් අවස්ථාවේ දී ඇති රාශි දෙක අනුලෝම වශයෙන් සමානුපාත වේ ද නොවේ ද යන්න ලියා දක්වන්න.

a. පොත් ගණන හා ඒවායේ මිල
b. ඒකාකාර වේගයෙන් චලනය වන වස්තුවක් ගමන් කළ දුර හා ඒ සඳහා ගත වූ කාලය
c. මෝටර් රථයක වේගය හා කිසියම් දුරක් ගමන් කිරීමට ගතවන කාලය
d. සමචතුරස්‍රයක පැත්තක දිග හා එහි පරිමිතිය
e. සමචතුරස්‍රයක පැත්තක දිග හා එහි වර්ගඵලය
f. වැඩක් නිම කිරීම සඳහා යෙදවිය යුතු මිනිසුන් ගණන හා ඒ සඳහා ගතවන දින ගණන
g. නිවසක පරිභෝජනය කරන විදුලි ඒකක ගණන හා මාසික බිල

10.2 ඒකීය ක්‍රමය භාවිතයෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳීම

එක ම වර්ගයේ සබන් කැට 3ක මිල රුපියල් 120ක් බව දී ඇති විට එම වර්ගයේ සබන් කැට 5ක මිල සෙවීමට ඇතැයි සිතමු.

මෙහි දී සබන් කැට 1ක මිල සොයා ඒ ඇසුරෙන් සබන් කැට 5ක මිල, ඔබ මීට පෙර ශ්‍රේණිවල දී උගෙන ඇති පරිදි, පහසුවෙන් සෙවිය හැකි ය.

සබන් කැට 3ක මිල	=	රු 120
සබන් කැට 1ක මිල	=	රු 120 ÷ 3
	=	රු 40
සබන් කැට 5ක මිල	=	රු 40 × 5
	=	රු 200

මෙම ගණනය කිරීම සිදු කළ ආකාරය මෙසේ ද විස්තර කළ හැකි ය.

මෙහි රාශි 2ක් ඇත. ඒවා නම් සබන් කැට ගණන හා මිලයි. මුලින් ම සිදු කොට ඇත්තේ එක් සබන් කැටයක මිල සෙවීමයි. එය රුපියල් 40 වේ. සබන් කැට 5ක මිල සෙවීම සඳහා මෙම එක් සබන් කැටයක මිල 5න් ගුණ කොට ඇත. මෙහි එක් සබන් කැටයක මිල යනු නියත අගයක් වන

$$\frac{\text{සබන් කැටවල මිල}}{\text{සබන් කැට ගණන}}$$

යන භාගයේ අගයයි.

ඒකකයක අගය පදනම් කරගෙන ගැටලුව විසඳීමේ ක්‍රමය ඒකීය ක්‍රමය නමින් හඳුන්වයි.

ඒකීය ක්‍රමය භාවිතයෙන් අනුලෝම සමානුපාත ආශ්‍රිත ගැටලු විසඳන ආකාරය පහත නිදසුන් මඟින් තව දුරටත් අධ්‍යයනය කරමු.

නිදසුන 1

එක ම වේගයෙන් ඇවිද යන පුද්ගලයෙක් මිනිත්තු 5ක් තුළ ඇවිද යන දුර මීටර 800ක් නම්, මිනිත්තු 12ක් තුළ ඔහු ඇවිද යන දුර ගණනය කරන්න.

මිනිත්තු 5දී ඇවිද යන දුර මීටර	=	800
මිනිත්තු 1දී ඇවිද යන දුර මීටර	=	800 ÷ 5
	=	160
මිනිත්තු 12දී ඇවිද යන දුර මීටර	=	160 × 12
	=	1 920

∴ මිනිත්තු 12දී ඇවිද යන දුර 1920 m වේ.

නිදසුන 2

ක්‍රිකට් ක්‍රීඩාව සඳහා යොදා ගන්නා එක සමාන පන්දු 10ක ස්කන්ධය කිලෝග්‍රෑම් 3ක් නම් එවැනි පන්දු 3ක ස්කන්ධය කොපමණ ද?

පන්දු 10ක ස්කන්ධය කිලෝග්‍රෑම් $= 3$
පන්දු 1ක ස්කන්ධය ග්‍රෑම් $= 3000 \div 10$
$= 300$
පන්දු 3ක ස්කන්ධය ග්‍රෑම් $= 300 \times 3$
$= 900$

පන්දු 3ක ස්කන්ධය 900 g වේ.

ඒකීය ක්‍රමය භාවිතයෙන් පහත අභ්‍යාසවල යෙදෙන්න.

10.2 අභ්‍යාසය

1. දොඩම් ගෙඩි 8ක මිල රුපියල් 320ක් නම් දොඩම් ගෙඩි 5ක මිල සොයන්න.

2. චීත්ත රෙදි මීටර 5ක මිල රුපියල් 750ක් නම් චීත්ත රෙදි මීටර 12ක මිල සොයන්න.

3. ඇපල් ගෙඩි 15ක් අඩංගු පාර්සලයක ස්කන්ධය කිලෝග්‍රෑම් 3.6ක් නම් ඇපල් ගෙඩි 8ක් අඩංගු පාර්සලයක ස්කන්ධය සොයන්න.

4. මුද්‍රණ යන්ත්‍රයකින් මිනිත්තු 5ක් තුළ පිටපත් 240ක් මුද්‍රණය කළ හැකි නම් මිනිත්තු 12ක් තුළ මුද්‍රණය කළ හැකි පිටපත් ගණන සොයන්න.

5. ඒකාකාර වේගයෙන් ගමන් ගන්නා මෝටර් රථයක් මිනිත්තු 15ක් තුළ කිලෝමීටර 12 ක දුරක් ගමන් කරයි නම් මිනිත්තු 40දී ගමන් ගන්නා දුර ගණනය කරන්න.

6. යතුරුපැදියක් ඉන්ධන ලීටර 2කින් කිලෝමීටර 90ක දුරක් ධාවනය කළ හැකි නම් ඉන්ධන ලීටර 5කින් ධාවනය කළ හැකි දුර ප්‍රමාණය සොයන්න.

7. ඒකාකාර වේගයෙන් ජලය ගලා එන පොම්පයකින් ලීටර 1000ක ධාරිතාවක් සහිත ටැංකියක් පිරවීමට ගතවන කාලය මිනිත්තු 5ක් නම් ලීටර 1600ක ධාරිතාවෙන් යුත් ටැංකියක් පිරවීමට ගතවන කාලය තත්පරවලින් සොයන්න.

10.3 අර්ථ දැක්වීම භාවිතයෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳීම

අනුලෝමව සමානුපාතික රාශි දෙකකින් පළමුවන රාශියේ ඕනෑ ම අගය දෙකක් අතර අනුපාතය, අනෙක් රාශියේ ඊට අනුරූප අගය දෙකෙහි අනුපාතයට සමාන වන බව මෙම පාඩමේ පළමු පරිච්ඡේදයේ දී පැහැදිලි කෙරිණි. එය පහත පරිදි වීජීයව ද දැක්විය හැකි ය. කිසියම් ද්‍රව්‍යය a ප්‍රමාණයක මිල රුපියල් u ද එම ද්‍රව්‍යයේ ම b ප්‍රමාණයක මිල රුපියල් v ද ලෙස සැලකුව හොත්



එවිට $a : b = u : v$ ලෙස ලියා දැක්විය හැකි ය.

භාග ආකාරයෙන් දැක්වුවහොත්, $\frac{a}{b} = \frac{u}{v}$ (හෝ $\frac{b}{a} = \frac{v}{u}$) ලෙස දැක්විය හැකි ය.

හරස් ගුණිතයෙන් $a \times v = b \times u$ ලෙස ලිවිය හැකි ය.

මෙම ලක්ෂණය භාවිතයෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳන ආකාරය පහත නිදසුන් මගින් අධ්‍යයනය කරමු.

නිදසුන 1

අඹ ගෙඩි 5ක මිල රුපියල් 75ක් නම් අඹ ගෙඩි 8ක මිල සොයන්න.

අඹ ගෙඩි 8ක මිල x ලෙස ගනිමු. එවිට, පහත පරිදි ඊ සටහනකින් මෙම තොරතුරු දැක්විය හැකි ය.

අඹ ගෙඩි ගණන		මිල (රු)
5	→	75
8	→	x

මෙම තොරතුරු පදනම් කරගෙන, පහත දැක්වෙන පරිදි වීජීය සමීකරණයක් ලියා, එය විසඳීමෙන් xහි අගය, එනම් අඹ ගෙඩි 8ක මිල සොයමු.

$$5 : 8 = 75 : x$$

එමනිසා, $\frac{5}{8} = \frac{75}{x}$

$$5x = 75 \times 8$$

$$x = \frac{75 \times 8}{5}$$

$$x = 120$$

මේ අනුව, අඹ ගෙඩි 8ක මිල රුපියල් 120කි.

නිදසුන 2

රුපියල් 500ට ගත් භාණ්ඩයක් 15%ක ලාභයක් ලැබෙන සේ විකිණිය යුතු මිල සොයන්න.

මෙහි දී, ගැටලුවෙහි දී ඇති තොරතුරු සමානුපාත යොදා ගැනීමට හැකි වන පරිදි සකස් කොට මෙසේ ලියමු. "රුපියල් 100කට මිල දී ගත් භාණ්ඩයක විකුණුම් මිල රුපියල් 115 නම් (ලාභය 15% නිසා) රුපියල් 500ට මිල දී ගත් භාණ්ඩයක විකිණුම් මිල සොයන්න.

රුපියල් 500 ට මිල දී ගත් භාණ්ඩයක විකිණුම් මිල රුපියල් x යැයි සිතමු.

ගත් මිල (රු)		විකුණුම් මිල (රු)
100	⟶	115
500	⟶	x

$100 : 500 = 115 : x$

$$\frac{100}{500} = \frac{115}{x}$$

$$100\,x = 115 \times 500$$

$$x = \frac{115 \times 500}{100}$$

$$x = 575$$

මේ අනුව, විකිණිය යුතු මිල රුපියල් 575කි.

10.3 අභ්‍යාසය

1. පහත දී ඇති එක් එක් සමානුපාතයේ හිස්තැනට ගැළපෙන අගය ලියා දක්වන්න.

a. 2 : 5 = 8 : ...... **b.** 3 : 4 = ... : 20

c. 5 : 3 = 40 : ...... **d.** 4 : 1 = ... : 8

e. 8 : ...... = 24 : 15 **f.** ...... : 6 = 35 : 30

2. පහත සඳහන් එක් එක් ගැටලුව, මුලින් ඊ සටහනක් ඇඳ ඉන්පසු වීජීය සමීකරණයක් ලියා සමානුපාත භාවිතයෙන් විසඳන්න.

a. සහල් කිලෝග්‍රෑම් 10ක මිල රුපියල් 850ක් නම් සහල් කිලෝග්‍රෑම් 7ක මිල සොයන්න.

b. ලෝහ වර්ගයක 9 cm^3ක ස්කන්ධය ග්‍රෑම් 108ක් නම් එම ලෝහ වර්ගයේ 12 cm^3ක ස්කන්ධය සොයන්න.

c. ඒකාකාර වේගයෙන් ගමන් කරන යතුරු පැදිකරුවකු පැය 4ක දී ගමන් කරන දුර කිලෝමීටර 240ක් නම් පැය 3ක දී ගමන් කරන දුර සොයන්න.

d. භාණ්ඩයක් විකිණීමේ දී 3% ක වට්ටමක් දෙනු ලබන වෙළඳසලකින් රුපියල් 800ක් වටිනා භාණ්ඩයක් මිලදී ගැනීමට අවශ්‍ය මුදල සොයන්න.

e. භාණ්ඩයක් විකිණීමේ දී 12% ක කොමිස් මුදලක් දෙනු ලැබේ නම් රුපියල් 15 000ක් වටිනා භාණ්ඩයක් සඳහා ලැබෙන කොමිස් මුදල කොපමණ ද?

f. පැන්සල් 4ක මිල රුපියල් 48 නම් රුපියල් 132කට ගත හැකි පැන්සල් ගණන සොයන්න.

g. බෝතල් 12ක මිල රුපියල් 4800 නම් රුපියල් 6000කට ගත හැකි බෝතල් ගණන සොයන්න.

10.4 විජීය ආකාරයට ලිවීමෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳීම

පැන් 1ක මිල රුපියල් 15ක් වේ නම්,

- පැන් 2ක මිල රුපියල් 30ක් වේ.
- පැන් 3ක මිල රුපියල් 45ක් වේ.
- පැන් 4ක මිල රුපියල් 60ක් වේ.

ඉහත අවස්ථා හතරේ දී ම, එක් එක් අවස්ථාවේ දී වැයවන මුදල ඊට අනුරූප පැන් ගණනින් බෙදූවිට ලැබෙන අගය සෑම විට ම නියත අගයක් වේ.

එනම්, $\dfrac{\text{වැය වූ මුදල}}{\text{පැන් ගණන}}$ = නියත අගයකි.

එම නියත අගය පැනක මිල වේ. ඒ අනුව x පැන් ගණනක් සඳහා වැයවන මුදල y නම්,

$\dfrac{y}{x} = k$ ලෙස ලිවිය හැකි ය; මෙහි k යනු නියතයකි.

එම සමීකරණය $y = kx$ ලෙස ද ලියා දැක්විය හැකි ය.

මෙම වීජීය සමීකරණය භාවිතයෙන් අනුලෝම සමානුපාත සම්බන්ධ ගැටලු විසඳන ආකාරය පහත නිදසුන් මඟින් අධ්‍යයනය කරමු.

නිදසුන 1

අභ්‍යාස පොත් 3ක මිල රුපියල් 75ක් නම් එවැනි අභ්‍යාස පොත් 5ක මිල සොයන්න.

අභ්‍යාස පොත් ගණන x ලෙසත් මිල y ලෙසත් ගත්විට,

$y = kx$ ලෙස ලිවිය හැකි ය; මෙහි k යනු නියතයකි. ගැටලුවේ දී ඇති තොරතුරු ඇසුරෙන් මෙම k හි අගය සෙවිය හැකි ය. අභ්‍යාස පොත් 3ක මිල රුපියල් 75 නිසා $x = 3$ වන විට $y = 75$ වේ.

මෙම අගයන්, සමීකරණයේ ආදේශයෙන්, $75 = k \times 3$ වේ.
මෙය විසඳීමෙන් $k = 25$ ලැබේ.

මෙම kහි අගය මුල් සමීකරණයේ ආදේශයෙන්, $y = 25x$ ලෙස, x හා y අතර සම්බන්ධය ලැබේ.

දැන්, මෙම සමීකරණය භාවිතයෙන්, ඕනෑ ම x අගයකට අනුරූප y අගය හෝ ඕනෑ ම y අගයකට අනුරූප x අගය සෙවිය හැකි ය.
ගැටලුවේ, අභ්‍යාස පොත් 5ක මිල සෙවිය යුතු නිසා, $x = 5$ විට y සෙවිය යුතු ය.

මේ සඳහා, $y = 25x$ සමීකරණයේ $x = 5$ ආදේශයෙන්,

$$y = 25 \times 5$$
$$= 125$$

ලෙස ලැබේ.

මේ අනුව, අභ්‍යාස පොත් 5ක මිල රුපියල් 125කි.

නිදසුන 2

වෙළෙන්දෙක් 20% ක ලාභයක් සහිතව රුපියල් 500කට මිලදී ගත් භාණ්ඩයක් විකුණන මිල සොයන්න.

භාණ්ඩයේ ගත් මිල රුපියල් x ලෙසත් විකුණන මිල y ලෙසත් ගත්විට $\frac{y}{x} = k$ ලෙස දැක්විය හැකි ය.

ගත් මිල රුපියල් 100 වන විට විකුණුම් මිල රුපියල් 120 වන නිසා $\frac{120}{100} = k$

ගත් මිල රුපියල් 500 වන විට විකුණුම් මිල රුපියල් y යැයි ගනිමු. එවිට $\frac{y}{500} = k$ යන සමීකරණය ලැබේ.

k නියත අගයක් වන නිසා

$$\frac{y}{500} = \frac{120}{100}$$ ලෙස ලිවිය හැකි ය.

එවිට $$y = \frac{120 \times 500}{100}$$

$$y = 600$$

භාණ්ඩයේ විකුණුම් මිල රුපියල් 600ක් වේ.

10.4 අභ්‍යාසය

මෙම අභ්‍යාසයේ ගැටලු විසඳීම සඳහා වීජීය සමීකරණ ක්‍රමය භාවිත කරන්න.

1. කමිස 3ක මිල රුපියල් 1200ක් නම් එවැනි කමිස 5ක මිල සොයන්න.

2. සමාන වේතන ලබන කම්කරුවන් අට දෙනකුට දිනකට ගෙවූ කුලිය රුපියල් 7 200ක් නම් කම්කරුවන් තුන්දෙනෙකුට දිනකට ගෙවිය යුතු කුලිය සොයන්න.

3. පරිමාණයට අඳින ලද සිතියමක සෙන්ටිමීටර 5කින් මීටර 25ක දුරක් දැක්වේ නම් සෙන්ටිමීටර 8කින් දැක්වෙන දුර ප්‍රමාණය සොයන්න.

4. සිසිල් බීම නිෂ්පාදනාගාරයක ඇති යන්ත්‍රයකින් පැය 5ක දී බීම බෝතල් 7 500ක් නිෂ්පාදනය කෙරේ නම් පැය 7ක දී නිෂ්පාදනය කෙරෙන බෝතල් ගණන සොයන්න.

5. පොත් වෙළඳසැලක සෑම මිලදී ගැනීමක දී ම 8%ක වට්ටමක් හිමි වේ නම් රුපියල් 1 200ක පොත් මිල දී ගන්නා පුද්ගලයෙකු විසින් පොත් සඳහා ගෙවනු ලබන මුදල සොයන්න.

10.5 විදේශ මුදල්

එක් එක් රටවල භාවිත කරන මුදල් ඒකකයක් ඇති බවත් එක් රටක මුදල් ඒකකයක වටිනාකම තවත් රටක මුදල් ඒකකය සමඟ හුවමාරු කර ගන්නා අනුපාතය එකිනෙකට වෙනස් බවත් අපි දනිමු. එක් රටක මුදල් ඒකකයක් සමඟ තවත් රටක මුදල් ඒකකයක් හුවමාරුවන අනුපාතය දැක්වීමේ දී **විනිමය අනුපාතිකය** යන වදන භාවිත වේ. එම අනුපාතිකය නිශ්චිත අගයක් නොවන අතර විවිධ හේතූන් මත විනිමය අනුපාතිකය දිනපතා ඉහළ පහළ යාම සාමාන්‍යයෙන් සිදු වේ.

රටවල් කීපයක භාවිත වන මුදල් ඒකක හා එම මුදල් ඒකක සඳහා එක්තරා දිනයක විනිමය අනුපාතික ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව පහත දක්වා ඇත.

මෙහි විනිමය අනුපාතිකය ලෙස දැක්වෙන්නේ අදාළ විදේශ මුදල් ඒකක එකක ශ්‍රී ලංකා රුපියල්වලින් වටිනාකමයි.

රට	විදේශ මුදල් ඒකකය	විනිමය අනුපාතිකය (රුපියල්)
ඇමරිකාව	ඇමරිකන් ඩොලර්	151.20
එංගලන්තය	ස්ටර්ලින් පවුම්	185.90
යුරෝපය	යූරෝ	160.60
ජපානය	යෙන්	1.33
ඉන්දියාව	ඉන්දීය රුපියල්	2.26
සෞදි අරාබිය	සෞදි රියාල්	40.32
සිංගප්පූරුව	සිංගප්පූරු ඩොලර්	107.30

(2017-03-05 දින අන්තර්ජාලය ඇසුරෙන්)

සමානුපාත පිළිබඳ දැනුම භාවිතයෙන් විනිමය අනුපාතික සම්බන්ධ ගැටලු විසඳන ආකාරය දැන් සලකා බලමු.

නිදසුන 1

ඇමරිකන් ඩොලරයක විනිමය අනුපාතිකය රුපියල් 151ක් වූ දිනක ඇමරිකන් ඩොලර් 50ක මුදලක් ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කරගත් පුද්ගලයකුට හිමිවන මුදල ශ්‍රී ලංකා රුපියල් කීයක් වේ ද?

ඇමරිකන් ඩොලර් 1ක වටිනාකම = රු 151

ඇමරිකන් ඩොලර් 50ක වටිනාකම = රු 151×50

= රු $\underline{\underline{7550}}$

නිදසුන 2

එංගලන්තයේ සංචාරයක යෙදෙන පුද්ගලයෙක් ස්ටර්ලින් පවුමක විනිමය අනුපාතියක රුපියල් 185ක් වූ දිනක රුපියල් 74 000ක මුදලක් ස්ටර්ලින් පවුම්වලට මාරුකර ගනියි. ඔහුට හිමිවන ස්ටර්ලින් පවුම් ගණන කොපමණ ද?

රුපියල් 185ක වටිනාකම = ස්ටර්ලින් පවුම් 1

රුපියල් එකක වටිනාකම = ස්ටර්ලින් පවුම් $\frac{1}{185}$

රුපියල් 74 000ක වටිනාකම = ස්ටර්ලින් පවුම් $\frac{1}{185} \times 74\,000$

= ස්ටර්ලින් පවුම් 400

(මෙහි දී $\frac{1}{185}$ දශම ආකාරයට නොහරවා තබා ගත් විට සුළු කිරීම පහසු වේ).

එමනිසා, හිමිවන ස්ටර්ලින් පවුම් ගණන 400කි.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

10.5 අභ්‍යාසය

ඉහත වගුවේ දැක්වෙන විනිමය අනුපාතික භාවිතයෙන් පහත අභ්‍යාසයේ යෙදෙන්න.

1. විදේශ රටක සේවයේ යෙදෙන පුද්ගලයෙකුගේ මාසික වැටුප ඇමරිකන් ඩොලර් 1500ක් නම් ඔහුට හිමිවන වැටුප, ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණ ද?

2. ජපානයෙන් ආනයනය කරන රූපවාහිනී යන්ත්‍රයක මිල යෙන් 12 500ක් නම් රූපවාහිනී යන්ත්‍රයේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණ ද?

3. වැඩිදුර අධ්‍යාපනය සඳහා එක්සත් රාජධානියට යන ශිෂ්‍යත්වධාරියෙකුට මසකට ලැබෙන දීමනාව ස්ටර්ලින් පවුම් 2500 නම් එම මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් සොයා දක්වන්න.

4. තීරු බදු රහිත වෙළඳසැලක විකිණීමට තිබූ යූරෝ 750ක් වටිනා ක්‍රීඩා භාණ්ඩයක් මිල දී ගැනීම සඳහා ගෙවිය යුතු මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණ ද?

5. ඉන්දියාවේ සංචාරයේ යෙදෙන වන්දනාකරුවෙකු ශ්‍රී ලංකා රුපියල් 56 500ක් ඉන්දියානු රුපියල්වලට මාරු කරනු ලබයි නම් ඔහුට හිමිවන ඉන්දීය රුපියල් ගණන කොපමණ ද?

6. ශ්‍රී ලංකාවෙන් සිංගප්පූරුවට අපනයනය කළ රුපියල් 600 880ක් වටිනා නිමි ඇඳුම් තොගයක් සඳහා ලැබෙන සිංගප්පූරු ඩොලර් ගණන කොපමණ ද?